කෘෂි හා අහාර තාක්ෂණය

10 ශ්‍රේණිය – 2019 – I වාරය

I කොටස

- සියළුම ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.නිවැරදි පිලිතුර යටින් ඉරක් අඳින්න.

1. මිනිසාගේ පැවැත්ම සඳහා අවශ්‍ය ආහාර, ඇඳුම්, ඖෂධ වැනි දෑ තමා විසින් ම සපයා ගන්නා ලද කෘෂිකර්මාන්තය හඳුන්වන්නේ,
   (1)යැපුම් කෘෂි කර්මාන්තය ලෙසිනි (2)වාණිජ කෘෂි කර්මාන්තය ලෙසිනි
   (3)දේශිය කෘෂි කර්මාන්තය ලෙසිනි (4)වතු කෘෂි කර්මාන්තය ලෙසිනි
2. 'අහසින් වැටෙන එක දිය බිඳුවක් හෝ මිනිසාගේ ප්‍රයෝජනයට නොගෙන මහ මුහුදට ගලා යෑමට ඉඩ නොතැබිය යුතුයි' මෙම කියමන ප්‍රකාශ කරන ලද්දේ,
   (1)ධාතුසේන රජතුමා විසිනි (2)මහසෙන් රජතුමා විසිනි
   (3)මහා ජරාක්‍රමබාහු රජතුමා විසිනි (4)වසභ රජතුමා විසිනි
3. අනුරාධපුර යුගයේ ඉදි කෙරුණු ප්‍රථම වැව කුමක්ද?
   (1)කලා වැව (2)මින්නේරිය වැව (3)කන්තලේ වැව(4)අභය වැව (බසවක්කුලම)
4. වාරි කර්මාන්තයේ දී එක වැවකින් පෝෂණය වන ප්‍රදේශය ඊළඟ වැවේ ජල පෝෂක ප්‍රදේශය ලෙස පවත්වා ගෙන යන ලදී. මෙය හඳුන්වනු ලද්දේ,
   (1)වැව් ඉස්මත්ත ලෙසිනි (2) එල්ලංගා පද්ධතිය ලෙසිනි
   (3)සොරොව්ව ලෙසිනි (4)බිසෝකොටුව ලෙසිනි
5. කෘෂි ඉතිහාසයේ ඇළහැර ඇළ ඔස්සේ මින්නේරිය වැව හා කන්තලේ වැවට ජලය ලබා දුන්නේ කුමන ගඟ හරස් කොටද?
   (1)අඹන් ගඟ (2)නිල්වලා ගඟ (3)වලවේ ගඟ (4)මහවැලි ගඟ
6. දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටවනු ලැබූ වර්ෂය වන්නේ,
   (1)1910 (2)1911 (3)1912 (4)1913
7. A - භූමිය හිඟවීම
   B - හිතකර පරිසර තත්ව පැවතීම
   C - ශ්‍රමය හා යටිතල පහසුකම්
   ඉහත කරුණු අතරින් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය සඳහා ඇති විභවයක් වන්නේ,
   (1)A හා B පමණි (2)B හා C පමණි(3)A හා C පමණි(4)A,Bහා C වේ
8. 1960 දශකයේ අග භාගයේ දී ශ්‍රී ලංකාවේ කෘෂි බෝග වල අස්වනු කැපී පෙනෙන ලෙස වැඩිවීමක් සිදුවූයේ,
   (1)ආනයන කෘෂි ද්‍රව්‍ය වැඩිවීම නිසාය (2)විදේශීය බලපෑම් නිසාය
   (3)හරිත විප්ලවය නිසාය (4)කාර්මික විප්ලවය නිසාය
9. රටක් තුළ කිසියම් වර්ෂයක දී නිෂ්පාදනය කරනු ලබන සියලුම භාණ්ඩ හා සේවාවල වටිනාකම හැඳින්වෙන්නේ,
   (1)දළ ජාතික නිෂ්පාදනය ලෙසිනි (2)කාර්මික නිෂ්පාදනය ලෙසිනි
   (3)ආනයන නිෂ්පාදනය ලෙසිනි (4)දළ දේශීය නිෂ්පාදනය ලෙසිනි
10. පාංශු වර්ණය නිර්ණය කර ගැනීම සිදු කරනුයේ,
    (1)මක්සල් වර්ණ සටහන මගිනි (2)P^H මීටරය මගිනි
    (3)පාංශු පැතිකඩ මගිනි (4)පාංශු ජනන ක්‍රියාවලිය මගිනි
11. රතු පැහැයට හුරු පසක වැඩිපුර අඩංගු විය හැක්කේ,
    (1)කාබනික ද්‍රව්‍ය වේ (2)කැල්සියම් ද්‍රව්‍ය වේ(3)යකඩ අයන වේ(4)මැටි කලිල වේ
12. පසක පාංශු ප්‍රතික්‍රියාව යනු,
    (1)ආම්ලිකතාවයයි (2)භාෂ්මිකතාවයයි (3)ලවනතාවයයි(4)ආම්ලික හෝ භාෂ්මිකතාවයයි
13. අධික ලෙස ආම්ලික ලක්ෂණ පෙන්නුම් කරන පසක් උදාසීන කිරීම සඳහා යෙදිය හැකි වන්නේ,
    (1)පිජ්සම් (2)ඩොලමයිට් (3)ගෙන්දගම් (4)යූරියා
14. පසක P^Hපරාසය 4.5-6.5 ලෙස පවතිනම් එම පස්,
    (1)උදාසීන පසකි (2)භාෂ්මික පසක (3)ආම්ලික පසක (4)ප්‍රභල භාෂ්මික පසකි
15. පහත දැක්වෙන පාෂාණ වර්ග අතරින් ආග්නේය පාෂාණයක් වන්නේ මින් කුමක්ද?
    (1)වැලිගල් (2)ෂේල් (3)නයිස් (4)ග්‍රැනයිට්

16. පාංශු පැතිකඩක සංචායක කලාපය ලෙස හඳුන්වන්නේ,

(1)C කලාපය (2)R කලාපය (3)B කලාපය (4)A කලාපය

17. අන්තර්ජාතික පාංශු විද්‍යා සංගමයේ වර්ගීකරණය අනුව රොන්මඩ අයත් වන කාණ්ඩය වන්නේ,
(1) 0.2mm-0.02mm (2) 2mm-0.2mm
(3) 0.02mm-0.0002mm (4)0.002 mm වඩා අඩුය

18. රෝල් ක්‍රමය මගින් පාංශු වයනය සෙවීමේ දී තෙත් කළ පස රෝල් කර මුදුවක් සේ නැවිය හැකි නම් එම පස කුමන පසක් ද?
(1)මැටි ලෝම පසකි (2)වැලි ලෝම පසකි (3)මැටි පසකි (4)වැලි පසකි

19. පාංශු ව්‍යුහය ආරක්ෂා කිරීමට ගතහැකි පියවරක් වන්නේ මින් කුමක්ද?
(1)එකම ගැඹුරට වැඩි ගණනක් පස පෙරළීම (2)පසට කාබනික ද්‍රව්‍ය යෙදීම
(3)සෝඩියම් ලවණ අධිකව පසට එක් කිරීම (4)පාංශු සංරක්ෂණ ක්‍රම ඉවත් කිරීම

20. පාංශු ජීවීන් මගින් ඇති කරනු ලබන අහිතකර බලපෑමක් වන්නේ මින් කුමක්ද?
(1)පස මිශ්‍ර කිරීම (2)නයිට්‍රීහරණය (3)පාංශු කැටිති සෑදීම (4)කාබනික වියෝජනය කිරීම

21. පාංශු ජල ආකාරවලින් ශාක වලට ලබා ගත හැකි ජල ආකාරය වන්නේ,
(1)ජලාකර්ෂණ ජලය පමණි (2)කේශාකර්ෂණ ජලය පමණි
(3)ජලාකර්ෂණ ජලය හා කේශාකර්ෂණ ජලය පමණි (4)ගුරුත්වාකර්ෂණ ජලය පමණි

22. ශ්‍රී ලංකාවේ බහුලව දැකිය හැකි පාංශු ව්‍යුහ ආකාරය වන්නේ,
(1)තණි කණිකා (2)ස්ථම්භික (3)අණු කෝණාකාර (4)කැටිති

23. පහත ලක්ෂණ අතරින් පාංශු රසායනික ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?
(1)පාංශු ගැඹුර (2)පාංශු ප්‍රතික්‍රියාව (3)පාංශු ව්‍යුහය (4)පාංශු වර්ණය

24. ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශවල බහුලව දැකිය හැකි පස් කාණ්ඩය වන්නේ,
(1)රතු කහ පොඩ් සොලික් පස (2)ලැටසොලික් පස (3)රතු දුඹුරු පස (4)දියලු පස

25. සූර්ය විකිරණමානය මගින් මනිනු ලබන දේශගුණික සාධකය වනුයේ,
(1)ආලෝකයේ ගුණාත්මක බව (2) ආලෝක තීව්‍රතාවය
(3)ආලෝකයේ වර්ණය (4)ආලෝකය පවතින කාලසීමාව

26. සුළඟේ වේගය මනිනු ලබන ඒකකය වන්නේ,
(1) Kmh^{-1} (2) ms^{-2} (3) mh^{-1} (4) Kms^{-1}



27. ඉහත ප්‍රස්තාරය මගින් නිරූපණය වන්නේ,
(1)ශාකයක ප්‍රභාසංස්ලේෂණය සඳහා බලපාන සාධකයි.
(2)ප්‍රභාසංස්ලේෂණය කෙරෙහි උෂ්ණත්වයේ බලපෑමකි .
(3)ප්‍රභාසංස්ලේෂණය කෙරෙහි ආලෝකයේ බලපෑමයි.
(4)ප්‍රභාසංස්ලේෂණය කෙරෙහි ආර්ද්‍රතාවයේ බලපෑමයි.

28. ඉහත ප්‍රස්තාරයට අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1)උෂ්ණත්වය වැඩිවීමත් සමඟ ප්‍රභාසංස්ලේෂණ වේගය අඩුවේ.
(2)උෂ්ණත්වය වැඩිවීමත් සමඟ ප්‍රභාසංස්ලේෂණ වේගය වැඩි වේ.
(3)උෂ්ණත්වය වැඩිවුවද ප්‍රභාසංස්ලේෂණ වේගය නියතව පවතී.
(4)උෂ්ණත්වය වැඩිවීමත් සමඟ ප්‍රභාසංස්ලේෂණ වේගය යම් උපරිමයක් කරා ළඟාවී පසුව අඩුවේ.

29. මෙහි ප්‍රභාසංස්ලේෂණ වේගය උපරිමය කරා ළඟා වී ඇති උෂ්ණත්ව පරිසය වනුයේ,
(1)20^0C - 35^0C (2) 10^0C - 30^0C (3) 23^0C- 28^0C (4) 0^0C-35^0C

30. නිරිත දිග මෝසම් මගින් ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන කාල වනුයේ,

(1)නොවැම්බර් - පෙබරවාරි (2) පෙබරවාරි - සැප්තැම්බර්
(3අප්‍රේල් - සැප්තැම්බර් (4)මැයි - සැප්තැම්බර්

31. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය කෙරෙහි හිතකර බලපෑමක් ඇති නොකරණ වර්ෂාපතන ක්‍රමය වන්නේ,
   (1)වාසුළි (2)සංවහන වැසි
   (3)නිරිතදිග මෝසම් සුළං (4)ඊශාන දිග මෝසම් සුළං
32. ඊශාන දිග මොසම් සුළං මඟින් වර්ෂාව ලැබෙන ප්‍රදේශයක් වන්නේ,
   (1)ගාල්ල (2)නුවරඑළිය (3)අම්පාර (4)මාතර
33. ශ්‍රී ලංකාවේ මහ කන්නය සඳහා ගොවීන් බිම් සැකසීම ආරම්භ කරනු ලබන කාලසීමාව,
   (1)ජනවාරි-පෙබරවාරි (2)ඔක්තෝම්බර්-නොවැම්බර් (3)මාර්තු-අප්‍රේල් (4) මැයි-ජුනි
34. විවිධ ප්‍රදේශ වල පරිසර උෂ්ණත්වය එකිනෙකට වෙනස්වීම කෙරෙහි බලගනු ලබන සාධකයක් නොවනුයේ,
   (1)උච්චත්වය (2)අභ්‍යන්තර ධීවර කර්මාන්තය
   (3)මුහුදේ සිට ඇති දුර ප්‍රමාණය (4) අභ්‍යන්තර ජලාශ පිහිටා තිබීම
35. A - දඬු කැබලි මුල් ඇද්දවීම සඳහාය
   B -පුෂ්ප පරාගනය සඳහා
   C-බීජ ප්‍රරෝහනය සඳහා
   ඉහත කෘෂිකර්ම කටයුතු අතරින් උෂ්ණත්වය හිතකර ලෙස බලපානු ලබන්නේ,
   (1)A පමණි (2)B පමණි (3)A,Bපමණි (4)A,C පමණි
36. අඩු ආලෝක තීව්‍රතාවයක් ප්‍රිය කරනු ලබන ශාක කාණ්ඩය වන්නේ,
   (1)ඇන්තූරියම්, බිගෝනියා (2)පොල්, ගම්මිරිස් (3)වී, ගම්මිරිස්(4)කෝපි, මිරිස්
37. ආලෝකය පවතින කාලසීමාව ශාකයකට සෘජු ලෙසම බලපානු ලබන ක්‍රියාවලිය වනුයේ,
   (1)ද්‍රව්‍ය පරිවහනය (2)වාෂ්පීකරණය (3) පුෂ්පීකරණය (4)උත්ස්වේදනය
38. දින උදාසීන ශාකයක් සඳහා උදාහරණ වනුයේ,
   (1)කැරට් (2)රාබු (3)අර්තාපල් (4)පොල්
39. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වාර්ෂික වර්ෂාපතන ප්‍රමාණය නිවැරදිව දක්වා ඇත්තේ,
   (1)1750mm ට අඩු (2)1750 mm ට වැඩි (3)1500mm ට අඩු (4)17500mm-2500mm
40. පොඒසිසේ කුලයට අයත් බෝග කාණ්ඩය වන්නේ,
   (1)රාබු, ගෝවා, නෝකෝල්, මල්ගෝවා (2)මිරිස්, බටු, තක්කාලි, අර්තාපල්
   (3)මෑ, කව්පි, මුං, උඳු (4)වී, බඩඉරිගු, කුරක්කන්, සෝගම්

කෘෂි හා අහාර තාක්ෂණය

10ශ්‍රේණිය – 2019 – I වාරය

II කොටස

- **පළමුවන ප්‍රශ්ණය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා සහභාගී වූ 10 ශ්‍රේණියේ සිසුන් හෝමාගම ප්‍රදේශයේ කෘෂිකර්ම ගොවිපළක් නරඹන ලදී. මෙහිදී පස හා දේශගුණික සාධක පිළිබඳව ඔවුන් වැඩි අවධානයක් යොමු කරන ලදී.
   (1) මෙම ගොවිපළ අයත් කෘෂි දේශගුණික කලාපය නම් කරන්න.
   (2) මෙම ගොවිපළේ ඔවුන් නිරීක්ෂණය කරන ලද එළවළු බෝග හා පළතුරු බෝග 2 බැගින් ලියන්න.
   (3) මෙම ප්‍රදේශයේ සුලබව දක්නට ලැබිය හැකි පස් කාණ්ඩය නම් කරන්න.
   (4) ඉහත පස් කාණ්ඩය පවතින වෙනත් ප්‍රදේශ 2 ක් නම් කරන්න.
   (5) මෙම ගොවිපළ තුළ කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන ක්‍රමයක් නම් කරන්න.
   (6) ගොවිපළ තුළ පාංශු සංරක්ෂණය සඳහා අනුගමනය කර ඇති උපක්‍රම 2ක් නම් කරන්න.
   (7) මෙම ගොවිපළේ නියමිත කාලපරාසයක් තුළ වායුගෝලයේ පැවති උපරිම උෂ්ණත්වය හා අවම උෂ්ණත්වය මැනීමට භාවිතා කරන උපකරණයක් ලියන්න.
   (8) මෙම ප්‍රදේශයට බහුලව ලැබෙන වර්ෂාපතන ක්‍රම 2 ක් නම් කරන්න.
   (9) මෙම ගොවිපළේ වගා කිරීමට සුදුසු කුකර්බිටේසියේ කුලයේ බෝග 02 ක් සඳහන් කරන්න.
   (10)මෙම ගොවිපළේ වගා කරනු ලබන ආහාර සඳහා ප්‍රයෝජනයට ගන්නා බෝග කාණ්ඩ 04 ක් උදාහරණ සමග දෙන්න.

02. ශ්‍රී ලංකාවට නිදහස ලැබීමත් සමගම කෘෂි කර්මාන්තයේ ද විශාල වෙනස්වීම් ඇතිවිය.
  (1) එකල ආරම්භ කල සංවර්ධන යෝජනා ක්‍රමයක් නම් කරන්න.
  (2) බහු කාර්ය සංවර්ධන යෝජනා ක්‍රම වල පොදු අරමුණු 04 ක් සඳහන් කරන්න.
  (3) a. හරිත විප්ලවය යනු කුමක්ද?
      b. හරිත විප්ලවය නිසා මෙරට සිදුවූ වෙනස්කම් හතරක් සඳහන් කරන්න.

03. කාලගුණික දත්ත රැස්කරන මධ්‍යස්ථානයක පහත දැක්වෙන ඇටවුම සකස් කර තිබෙනු දක්නට ලැබිණි.



  (1) a. ඉහත රූප සටහනෙහි දැක්වෙන කෘෂි කාලගුණික උපකරණය නම් කරන්න.
      b. එම රූප සටහනෙහි A,B,C හා D කොටස් නම් කරන්න.
      c. ඉහත උපකරණය ස්වයංක්‍රීය වර්ෂාමානයකින් වෙනස් වන්නේ කෙසේද?
  (2) ඉහත උපකරණය මගින් මනිනු ලබන දේශගුණික පරාමිතිය සහ එහි පාඨාංක ලබා ගන්නා ඒකකය නම් කරන්න.
  (3) ඉහත ඇටවුම භාවිතයෙන් වඩාත් නිවැරදි පාඨාංක ලබා ගැනීම සඳහා එය ස්ථාපනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 04 ක් සඳහන් කරන්න.

04. (1)a. පාංශු කාබනික ද්‍රව්‍ය යනු කුමක්ද?
      b. පාංශු කාබනික ද්‍රව්‍ය බෝග වගාවට වැදගත් වන ආකාර 2 ක් ලියන්න.
(2)a. පාංශු ක්ෂුද්‍රජීවීන් ආකාර 02 ක් නම් කරන්න.
      b. පාංශු ක්ෂුද්‍ර ජීවීන්ගේ හිතකර බලපෑම් 2 ක් ලියන්න.
(2) පාංශු වයනය කෘෂිකාර්මිකව වැදගත් වන ආකාර 3 ක් නම් කරන්න.

05. කෘෂි කර්මාන්තයේ දී පාංශු ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීම මගින් ගුණාත්වයෙන් යුතු සරු අස්වැන්නක් ලබා ගත හැක.
  (1) a. පාංශු ව්‍යුහය යනු කුමක්ද?
      b. පාංශු ව්‍යුහ ආකාර 2 ක් රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න.
  (2) a. බෝග වගාවට පාංශු වාතය වැදගත් වන අවස්ථා 2 ක් ලියන්න.
      b. පසක පාංශු වාතනය දියුණු කළ හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.
  (3) පසෙහි ජලය පවතින ආකාර 03 ක් ලියන්න.

06. පසේ සිදුවන විවිධ රසායනික ප්‍රතික්‍රියා බෝග වගාවටද බලපානු ලැබේ.
  (1) a. පාංශු රසායනික ලක්ෂණ 2 ක් ලියන්න.
      b. ඉහත රසායනික ලක්ෂණ අතුරින් එක් ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න.
  (2) a. පසෙහි P^H අගය මනිනු ලබන ක්‍රම 2 ක් නම් කරන්න.
      b. පසක් ආම්ලික වීමට හේතු 2 ක් ලියන්න.
      c. පසේ ආම්ලිකතාවය උදාසීන කළ හැකි ක්‍රමයක් ලියන්න.
  (3) ශ්‍රී ලංකාවේ බහුලව ව්‍යාප්ත වී ඇති පස් කාණ්ඩ 2 ක් නම් කරන්න.